11 ශ්‍රේණිය

# ගෘහ ආර්ථික විද්‍යාව

නිපුණතාවය 13

නිවැරදි පිළිවෙත් අනුගමනය කරමින් දරුවන් හදා වඩා ගනියි.

## ළදරු සංවර්ධනය

එම්.ඒ.එස්.මනිමේන්ද්‍ර මිය.
බප / ගම් ශ්‍රී චන්ද්‍රජෝති මහා විද්‍යාලය.

නිපුණතාවය : 13) නිවැරදි පිළිවෙත් අනුගමනය කරමින් දරුවන් හදා වඩා ගනියි.

නිපුණතා මට්ටම : 13.4) පළමු වසර තුළ දරුවාගේ සංවර්ධනය හඳුනා ගනිමින් ඔවුන් රැකබලා ගනියි.

## ක්‍රියාකාරකම්

උපදෙස් :- පෙළ පොතේ දරුවන් රැකබලා ගැනීම පාඩම කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න .

1) දරුවකුගේ උපත් බර වන්නේ,

1) 2.5kg

2) 2kg

3) 2.250kg

4) 1.5kg

2) මාස 3 - 4 පමණ වයසේ දී දරුවාගේ වාලක වර්ධනයක් වන්නේ ,

1) අත් පා වේගයෙන් චලනය කරයි.

2) අත්ලෙන් අල්ලයි.

3) ගෙල ඔසවයි.

4) උදව් නැතිව තනිව වාඩි වෙයි.

3) මාස 12 අවසානයේ දී දරුවාට ලබාදිය යුතු එන්නතක් වන්නේ ,

1) ත්‍රිත්ව එන්නත සිව්වන මාත්‍රාව

2) MMR එන්නත පළමු මාත්‍රාව

3) පංච සංයුජ එන්නත දෙවන මාත්‍රාව

4) B.C.G එන්නත

6) දරුවා රැකබලා ගැනීමේ දී මානසික වර්ධනය , භාෂා වර්ධනය , චිත්තවේග වර්ධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් ලියන්න .

..........................................................................

..........................................................................

..........................................................................

( ලකුණු - 03 )

7) මව්කිරි දීමෙන් මවට සැලසෙන වාසි තුනක් ලියන්න .

..........................................................................

..........................................................................

..........................................................................

( ලකුණු - 03 )

8) දරුවාගේ සාමාජීය වර්ධනයට ගත හැකි පියවර තුනක් ලියන්න .

..............................................................................

..............................................................................

..............................................................................

( ලකුණු - 03 )

9) මුල් ම මව්කිරි හඳුන්වන නම කුමක්ද ?

..............................................................................

( ලකුණු - 01 )

10) ළදරුවාගේ මොළය වර්ධනයට උදවුවන අත්‍යවශ්‍ය මේද අම්ලය කුමක්ද ?

..............................................................................

( ලකුණු - 01 )

# පිළිතුරු

1) 1 2) 3 3) 2 4) 1 5) 1

6) 1. මුහුණට මුහුණ බලා දරුවා සමග ලයාන්විතව කතා කිරීම .

2. ආදරයෙන් තුරුළු කර ගැනීම , සිප ගැනීම.

3. නැළවිලි ගීත ගැයීම.

4. කතන්දර කීම.

5. දරුවා වචන කතා කිරීම ආරම්භ කළ විට ඒ සඳහා සඳහා ප්‍රතිචාර දක්වමින් සරල වචන භාවිතයට උනන්දු කිරීම.

6. පරිසරය නැරඹීමට අවස්ථාව දීම.

7. පරිසරයේ වෙනස්කම් පිළිබඳව දරුවාට තේරුම් ගත හැකි වන සේ කතා කිරීම. (ආහාර ගන්නා විට ආහාරයේ නම , වර්ණය , රසය ගැන කතා කිරීම )

7) 1. මවගේ ගර්භාෂය නැවත යථා තත්ත්වයට පත්වීමට හේතු වීම.

2. ස්වභාවික උපත් පාලනයට කිසියම් බලපෑමක් ඇති කිරීම.

3. මවට පියයුරු පිළිකා ඇතිවීමේ ප්‍රවණතාව අඩු වීම.

8) 1. පවුලේ සාමාජිකයන් දරුවා සමඟ නිතර කතා කිරීම.

2. දරුවා සුරතල් කිරීම.

3. ඥාතීන් එකතුවන ස්ථානවලට දරුවා රැගෙන යාම.

4. දරුවා සමඟ සෙල්ලම් කිරීම.

5. කුඩා දරුවන්ගේ ඇසුර ලබා දීම.

6. දරුවාගේ වයසට උචිත ආරක්ෂිත උපකරණ මෙවලම් ක්‍රීඩා භාණ්ඩ ලබා දීම.

9) කොලොස්ට්‍රම් හෙවත් නවත්තන

10) DHA (අත්‍යවශ්‍ය මේද අම්ලයකි )

11 ශ්‍රේණිය

ගෘහ ආර්ථික විද්‍යාව

නිපුණතාවය 13

නිවැරදි පිළිවෙත් අනුගමනය කරමින් දරුවන් හදා වඩා ගනියි.

# නැවතත් හමුවෙමු.....

පාඩම : - ළදරු සංවර්ධනය